# ශ්‍රී ලාංකික පුවත්පත්හි කතුවැකිවල භාෂා භාවිතය

## සති අන්ත පුවත්පත් ආශ්‍රිතව කරන අධ්‍යයනයකි.

(1980- 2005 දක්වා කාලය තුළ තෝරා ගත් පුවත්පත් ඇසුරිනි.)

විභාග අංකය - FGS/M/MSSc/2006/04

ප්‍රවේශ අංකය: 1141
වර්ග අංකය:

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති (ජනසන්නිවේදන) පරීක්ෂණයෙහි අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධනයකි.

2011

# සාරාංශය


වර්තමාන ලෝකයේ සන්නිවේදනයෙන් තොර මානව සමාජයක් පිළිබඳ සාකච්ඡා කළ නොහැකිය. එය රටක සංවර්ධනයට ද මානව පැවැත්මට ද අත්‍යවශ්‍ය සාධකයකි. නූතන ජනසන්නිවේදන මාධ්‍ය අතර මුල් ම බහුජන මාධ්‍ය වශයෙන් පුවත්පතට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. දශක දෙකකට වඩා වැඩි ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලාංකේය පුවත්පත් මාධ්‍යය මෙරට ජනතාවගේ සමාජ විඥානය කෙරෙහි ප්‍රබල බලපෑමක් සිදු කිරීමට හේතු වී ඇත.

භාෂාව සන්නිවේදන මාධ්‍යයකි. අද සියලූ ම ජනමාධ්‍ය සඳහා භාෂාවෙන් සිදු වන සන්නිවේදන කාර්යභාරය සුවිශේෂී වේ. සෑම පුවත්පතක ම විශේෂාංග ඇතුළත් වන අතර කතුවැකිය යනු පුවත්පතේ විශේෂාංග යටතේ පළ කරනු ලබන ප්‍රධාන රචනා විශේෂයකි. ඕනෑම පුවත්පතක දිනපතා පළ වන අනිවාර්ය විශේෂාංගය කතුවැකිය වන අතර මෙය පුවත්පතේ මැද පිටුවේ කුඩා ඉඩක් වසා ගනු ඇත. එය අඩංගු පිටුව ද වැකි පිටුව යනුවෙන් හඳුන්වන්නේ එහි ඇති විශේෂත්වය නිසයි. ආරම්භයේ සිට අද දක්වා සෑම පුවත්පතකම කතුවැකිය අනිවාර්ය අංගයක්ව පැවති බව පුවත්පත් පරිශීලනයේ දී දැකිය හැක. එමඟින් කරන බලපෑම ප්‍රබල වන අතර පුවත්පත් කතුවැකිය නිර්මාණාත්මක ලේඛන සමඟත් අඛණ්ඩව බැඳී පවතී. එයට හේතු වී ඇත්තේ කතුවැකියෙන් ද නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රියාවලියක් සිදු වන බැවිනි.

එසේම සිංහල පුවත්පත එයට ම ආවේණික වූ බසක් පදනම් කර ගනිමින් පරිණාමය වූ අතර විවිධ සමාජ බලවේගයන්ට මුහුණ දෙමින් කාලානුරූපව නිර්මාණාත්මකව වෙනස්වීම්වලට ලක් විය. මෙහිදී පුවත්පතේ කතුවැකිය කෙරෙහි භාෂාව මඟින් ඇති කරන බලපෑම සුවිශේෂී වන්නේ කතුවැකියෙන් ජනතාවගේ ආකල්ප වෙනස් කරමින් ජනමතය සකස් කිරීම සඳහා ප්‍රබල දායකත්වයක් සපයන බැවිනි. කතුවැකියේ භාෂාව කාලානුරූපව අර්ථවත් අයුරින් වෙනස් වී ඇති බවක් බහුතර පාඨක පිරිසකගේ මතය වී ඇත. පුවත්පත් භාෂාව මේ වන විට වෙනස් වී තිබුණත් එය වෙනස් වන සමාජයට අනුරූපව හැඩගැසිය යුතු බව ඉතා සුළු පාඨක පිරිසකගේ අදහස බව පර්යේෂණ නිගමනයෙන් සනාථ වී ඇත.

සිළුමිණ හා ඉරිදා ලංකාදීප පුවත්පත් 02 මෙරට පුවත්පත් අතර ප්‍රධාන වේ. එවැනි තත්ත්වයක් තුළ මෙම පුවත්පත් 02 යොදා ගනිමින් කරන ලද මේ පර්යේෂණයේදී සම්භාව්‍ය රීතියෙන් මිදුණු පුවත්පත් භාෂාව ක්‍රමානුකූලව සමකාලීන ලේඛන රීතියට යොමු වී ඇති බවක් දැකිය හැකි වේ. ජනතාවගේ විඥානයට කතා කරන කතුවැකිය රටේ පවතින සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලනික හේතු නිසා වෙනසකට ද භාජනය වී ඇත. පුවත්පත වැනි ජනසන්නිවේදන මාධ්‍යයක දී භාෂාව විවිධාකාරයෙන් වෙනස් විය හැක. එසේ වෙනස් වන භාෂාව කාලානුරූපව, අර්ථවත් අයුරින් වෙනස් විය විය යුතු අතර එම වෙනස්වීම කෙරෙහි ජනමාධ්‍යවේදියා සතුව ද ප්‍රධාන වගකීමක් පවතිනු ඇත.



මුරපද **(Keywords)**

කතුවැකිය (Editorial) / පුවත්පත (Newspaper)/ භාෂාව (Language)

ජනවිඥානය (Consciousness)/ නිර්මාණාත්මක සන්නිවේදනය (Creative Communication)